

# ඊශ්‍රායලය සහ දෙවියන්වහන්සේගේ අභිප්‍රාය

## (Israel and the Purpose of God)

- ෆ්‍රෙඩ් පියර්ස් -

# ඊශ්‍රායලය සහ දෙවියන්වහන්සේගේ අභිප්‍රාය

- ෆ්‍රෙඩ් පියර්ස් -

# පටුන


| | |
|---|---|
| හැඳින්වීම | 3 |
| ඉතිහාසයේ ආරම්භයයන් | 3 |
| දෙවියන්වහන්සේගේ පොරොන්දු සඳහා පසුබිම | 4 |
| ජාතිය දේශයට ඇතුලුවෙයි | 5 |
| රජතුමා ගැන පොරොන්දුව | 5 |
| ලෝකය සමඟ ගැටෙන විශ්වාසය | 6 |
| ක්‍රිස්තුස්වහන්සේ සඳහා සූදානම්වූ පරිසරය | 6 |
| විසුරුවා හරින ලද දෙවියන්වහන්සේගේ රැළ | 7 |
| නැවත එක්රැස්වීමේ බලාපොරොත්තුව | 8 |
| ලෝකය සඳහා දෙවියන්වහන්සේගේ අභිප්‍රාය | 10 |
| දිවැස්වරුන්ගේ පණිවිඩය | 11 |
| කුමන ආකාරයක ජනතාවක්ද? | 11 |
| යුදෙව් පුනරුදය කලින් දැනගත්හ | 12 |
| ඊශ්‍රායලයේ ප්‍රතිසමාදානය | 13 |
| අධ්‍යාත්මික කූටප්‍රාප්තිය | 14 |
| ඔවුන්ගේ දුක්විඳීමේ කතාන්තරය | 15 |
| ඔවුන් ලුහුබැඳ ආ ප්‍රේමය | 16 |
| හදවතින් නිහතමානී වන්නෝ | 17 |
| වචනය සඳහා ගුරුවරයෝ | 18 |
| උන්වහන්සේගේ නාමය වෙනුවෙන් දෙවියන්වහන්සේගේ ක්‍රියාව | 19 |
| අන්‍යජාතිකයන්ගේ වගකීම | 20 |
| මුලු ඊශ්‍රායල් ගලවනු ලබන්නේය | 21 |
| දිව්‍යමය නාටකය | 21 |
| පසුව ලිවීම | 22 |
| ප්‍රශ්න | 24 |

# ඊශ්‍රායලය සහ දෙවියන්වහන්සේගේ අභිප්‍රාය

## හැඳින්වීම

බොහෝ අරගලවලට මධ්‍යගතවූ එක් කුඩා භූමි ප්‍රදේශයක් ඇත. එම භූමිය ඊශ්‍රායල් දේශයයි. ලෝකයේ බලගතුම ආගම් තුනක් - යුදෙව්, ක්‍රිස්තියානි සහ ඉස්ලාම් - සංවර්ධනය මධ්‍යධ්‍යයේ එක් ජනතාවක් ඇත. එම ජනතාව ඊශ්‍රායල් ජනතාව වූ යුදෙව්වෝය.

## ඉතිහාසයේ ආරම්භයයන්

නයිල් සහ යුප්‍රටීස් මිටියාවත්වල පුරාණතම මහා ශිෂ්ඨාචාර ආරම්භ විය. දේශයට ජලය සැපයීම සඳහා ඇලමාර්ග සහ අමුණු හරහා ගලාගිය ජලය පාලනය කිරීමේ අවශ්‍යතාවයෙන් ඔවුන්ගේ වැඩීම සීඝ්‍ර විය. ආසියාව, අප්‍රිකාව සහ යුරෝපය සම්බන්ධ කල පටු බිම් තීරුවක් හරහා, ක්‍රි.පූ. 2000 වන විට මේ මිනිසුන් අතර අඛණ්ඩ සබඳතාවයක් ඇති වී තිබුනි. එම දේශයට පළමුව කානන් කීවද, පසුව එය ඊශ්‍රායල් දේශය විය. පසුව රෝමවරු එය පලස්තීනය යැයි නම් කලද, අද නැවතත් එය ඊශ්‍රායල් ලෙස හඳුන්වනු ලැබේ.

මෙම පටු බිම් ප්‍රදේශයේ බොහෝ ප්‍රමාණයක් පාෂාණමය කඳු, උතුරේ සිට දකුණට ගමන් කරන්නාවූ මහා මටියාවකින් දෙකට කණ්ඩානය වී ඇත. ඒ ගලීලයේ විල සිට ජෝර්දාන් නදිය දීගේ මළ මුහුද පහළ දක්වාය.

නැගෙනහිර සිට බටහිර එස්ඩ්‍රීලන් තැන්න මගින් මෙම කඳු නැවත වරක් දෙකට කණ්ඩනය වේ. යුදයාව මධ්‍යදරණිය දෙසට, සශ්‍රික ශැරොන් තැන්න සහ පහත් බිම් දක්වා බැවුම් වේ. බටහිර පිහිටි මේ වෙරළාසන්න තැන්න හරහා හෝ යොර්දාන් මිටියාවතින් නැගෙනහිරට පිහිටි කාන්තාර සානුව වාටිය ඔස්සේ, දමස්කයයට වූ මාහා මාර්ග ද්විත්වය විය. එතැන් සිට පල්මයිරාවේ ලිං මාර්ගයේ සංචාරකයෝ බැබිලෝනියාවට ගමන්

ගත්හ. වෙළඳාමට සහ යුද්ධයට තිබූ මාර්ග දෙක මේවා වූහ. මෙම මාර්ග දිගේ මහා ශිෂ්ඨාචාර මුණගැසින, නැත්නම් ඝට්ටණය වූහ. එසේත් නැතිනම් ඒකාබද්ධ වූහ. මෙම මහා මාර්ග ද්විත්ව මධ්‍යයේ යෙරුසලම බලවට පත්වූ කඳු සහිත බලකොටුවක් විය.

## දෙවියන්වහන්සේගේ පොරොන්දු සඳහා පසුබිම

යුප්‍රටීස් ගංගාවේ වූ උර් නගරයේ සිට, යුදෙව් සහ අරාබි දෙජාතියේම පූර්වජයා වූ ආබ්‍රහම් මෙම දේශයට පැමිණියේය. මෙම දේශයේදී ඔහුට උතුර, දකුණ, නැගෙනහිර සහ බටහිර බැලීමට අණකරණ ලදී. දෙවියන්වහන්සේ මෙසේ පැවසූ සේක:

> "නුඹේ ඇස් ඔසවා නුඹ සිටින ස්ථානයේ සිට උතුරුද, දකුණද, නැගෙනහිරු, බස්නාහිරද බලාපන්න. මක්නිසාද, නුඹ දන්නාවූ මුළු දේශය නුඹටද නුඹේ වංශයටද ("නුඹේ බීජයට") සදාකාලයටම දෙන්නෙමි." (උත්පත්ති 13:14-17)

මෙම ද්‍රව්‍යමය පොරොන්දුව වඩා උතුම් ආශිර්වාදයක පදනම වූයේ, උන්වහන්සේ ආබ්‍රහම් සහ ඔහුග් පෙළපත සදාකාලික ගිවිසුමකින් තමන්වහන්සේට සම්බන්ද කරන්නේ යැයි ප්‍රකාශ කල නිසාය.

> "නුඹටම නුඹෙන් පසුව නුඹේ වංශයටද ("නුඹේ බීජය") දෙවියන්වහන්සේ වන පිණිස" (උත්පත්ති 17:7)

තවදුරටත්, ආබ්‍රහම් බොහෝ පෙළපත්වලට පියාණන්වනවාට අමතරව ඔහුට එක් විශේෂිත පුද්ගල බීජයක්ද පොරොන්දු වෙන ලදී : එනම් <u>තමන්ගේ සතුරන්ගේ දොරටුව හිමිකර ගන්නා</u> (උත්පත්ති 22:17) සහ ඔහු තුළින් <u>පොළවේ සියලු ජාතීහු ආශිර්වාද ලබන</u> මනුෂ්‍යයෙකුය. (18 පදය)

උත්පත්ති 22:18 සඳහන් කරමින්, අපෝස්තුලුවර පාවුල් මෙසේ ලිවේය :

> "ඉතින් පොරොන්දු දෙන ලද්දේ ආබ්‍රහම්ටත් ඔහුගේ වංශයටත්ය. බොහෝ දෙනෙකුට මෙන්, වංශයන්ට නොකියා, එක්කෙනෙකුට මෙන්, නුඹේ වංශයටයි උන්වහන්සේ කියනසේක" (ගලාති 3:16)

අවසානයේදී සියලු මනුෂ්‍යය වාර්ගයා වැළඳගන්නාවූද, ආබ්‍රහම්,

ඔහුගේ පැවතෙන්නන් සහ ඔවුන් කැඳවාගෙන ආ දේශයද එමනිසා එකට සම්බන්ද කලේ දිව්‍යමය අභිප්‍රායක ආරම්භක ලක්ෂයේ ස්වරූපය ගන්නා ලෙසය.

## ජාතිය දේශයට ඇතුලුවෙයි.

කාන්තාරය තුළ ඔවුන්ගේ අයාලේ යෑම් වලදී, යාකොබ් තුළින් ආ ආබ්‍රහම්ගේ පැවතෙන්නෝ ඔවුන්ගේ මිසර වහල් භාවයෙන් පසුව ජාතියක් ලෙස නිර්මාණය කරන ලදී. කාන්තාරයේ සිට යොර්දාන් නදිය හරහා ගලාගිය ඔවුන්, ඔවුන්ගේ මීමුත්තෝ අමුත්තන්ට සිටි දේශය අත්පත් කර ගත්තේය. ලෝක බලවතුන්ගේ හමුවීමේ ලක්ෂය මත යුධෝපායගිලිව පිහිටුවුනු. කඳු මිටියාවත් සහ තැනිතලා වලින් විශේෂිත වූ මේ දේශය විසින් වසර දහසක් පමණ ඔවුන්ගේ ඉතිහාසය වාත්තු කරන ලදී. මෙම දේශය විවිධ දේශගුණික සහ දර්ශණීය තත්වයන් උරුම කරගත්තා පමණක් නොව එහි කඳුකර මධ්‍යස්ථානය වූ යෙරුසලම විදේශීන්ගේ නිරන්තර යාම් ඊම් සමඟ හුදෙකලාවද මිශ්‍ර කලේය. ඔවුන්ගේ භූගෝලීය පිහිටීම ඊශ්‍රායලයට පෘථිවියේ සියලු ජනතාව තම දෙවියන්වහන්සේ සඳහා සාක්ෂිකාරයෙකු වන්නට අවස්ථාව ලබා දුන් අතර, (ද්විතීය කථාව 4:5-8) ඔවුන් වටා හුන් ජාතීන්ගේ පිළිම වන්දනා පෙළඹවීමටද ඔවුන් අනාවරණය කළේය. අනතුර සහ අවස්ථාව වෙන් නොවී තිබුණි.

## රජතුමා ගැන පොරොන්දුව

කනාන් වලට ඇතුලු වී සියවස් ගණනාවකට පසු, දාවිත් සියොන් බලකොටුව යටත්කර, දෙවියන්වහන්සේ වෙනුවෙන් රාජ්‍යය කරමින්, එය රාජ්‍යයේ දේශපාලනික සහ අධ්‍යාත්මක මධ්‍යස්ථානය කළේය. ඔහුටද, අනෙකුත් ගීතිකා ලියුවන් සහ දිවැස්වරුන්ට මෙන්, ලෝකය කරා විහිදුනු දෙවියන්වහන්සේගේ පාලනය සඳහා තොරාගත් ලක්ෂ්‍යය සියොන් විය. (1ලේකම් 28:5, ගීතාවලි 68:16, 102:13-16, 110:2, 132:13, යෙසායා 2:3) ඔහුට පොරොන්දුව ලැබුනේ දාවිත් සියොන් මත "දෙවියන්වහන්සේට ගෘහයක්" ගොඩනංවන්නට සැලසුම් කළ විටයි.

> "ස්වාමින්වහන්සේ නුඹට ගෘහයක් ගොඩනගන බව නුඹට දන්වමි" (1 ලේකම් 17:10)
>
> "තාගේ වංශය සදාකල් ස්ථිර කරන්නෙමි. තාගේ සිංහාසනය සියලු පරම්පරා වලට පිහිටුවන්නෙමියි කියා.......... මාගේ මෙහෙකරුවූ දාවිත්ට දිවුරුම් දුනිමි" (ගීතාවලි 89:3-4)

පරමාදර්ශී රජෙකුගේ පැමිණීමට සහතිකයක් මේ ගිවිසුමෙන් දාවිත්ම සොයා ගත්තේය.

> "දෙවියන්වහන්සේ කෙරෙහි භය ඇතුව මනුෂ්‍යයන් කෙරෙහි ආණ්ඩුකරන ධර්මිෂ්ඨ ආණ්ඩුකාරයෙක් එන්නේය. ඒ තෙමේ වලාකුල් නැතිව ඉරු උදාවෙන කල්හි තිබෙන උදය අලෝකයද, වැස්සෙන් පසුව බබලන දීප්තිය කරණකොටගෙන පොළවෙන් පටන්ගන්නාවූ ලපටි තෘණ මෙන් වන්නේයෙ. (2 සාමුවෙල් 23:3-4)

"දාවිත්ගේ පුත්‍රයාගේ" බලාපොරොත්තුව - "දාවිත්ගේ ශරීරයෙහි පලය" - කාව්‍යමය සිහිනයක් නොවේ. ඊශ්‍රායලය සඳහා එය ඔවුන්ගේ ඉතිහාසය තුළ බලවත්ව ක්‍රියාකරන ශක්තියකි. සියලු යුගයයන් තුළ බයිබලය කියවන භක්තිවන්තයාට එය විශ්වාසයේ පදාර්ථයේ කොටසකි. (ගීතාවලි 89:3-4 බලන්න.)

## ලෝකය සමඟ ගැටෙන විශ්වාසය

රාජ්‍යයන් දෙකකට බෙදුනු ඊශ්‍රායලයේ පසු ඉතිහාසය පෙන්වන්නේ කාන්තාරයේදී ජාතියක් වශයෙන් ඔවුන් සකස් කරන ලද දෙවියන්වහන්සේ තුළ ඔවුන් සතු විශ්වාසයේ ගැටුමත්, ඔවුන් වටා තිබූ ලෝකයේ බලපෑමත්ය. එම ලෝකයේ බලපෑම ආගමික සහ දේශපාලනික වූ අතර, උතුරු සහ දකුණු රාජ්‍යයන් යටකල මහා විනාශයට හේතුව අර්ධ වශයෙන් ඔවුන් වටකර සිටි අන්‍යජාතික බලයයන් එකිනෙකා කෙරෙහි කෙටවීමේ ලෞකික නැනවත්කමේ උත්සාහයන්ය. පිටුවහල් කරන ලද දිවැස්වර එසකියෙල් යෙරුසලමට විනාශය ප්‍රකාශ කලද, එහි දෙවියන්වහන්සේගේ පොරොන්දුවේ බලාපොරොත්තුව ඉතිරි වී තිබුණි :

"ස්වාමී වූ දෙවියන්වහන්සේ මෙසේ කියන සේක: කිරීටය ගලවා දමාපන්න. ඔටුන්න අහක් කරපන්න.......... පෙරළාදමන්නෙමි පෙරළාදමන්නෙමි. අයිතිවාසිය ඇති තැනැත්තා එන තුරු එය තවත් නොවන්නේය. මම ඒක ඔහුට දෙන්නෙමි." (එසකියෙල් 21:26-27)

## ක්‍රිස්තුස්වහන්සේ සඳහා සූදානම්වූ පරිසරය

වසර 70 ක සිර අඩස්සියකින් පසු යුදා, ඊශ්‍රායලයට නැවත පැමිණියේය. ඔවුන්ගේ නැවත පැමිණීම යුදෙව් ඉතිහාසයේ පමණක් නොව,

සම්පූර්ණ ඉතිහාසයේම අතිමහත් සිද්ධීන් සඳහා පරිසරය සූදානම් කලේය. යුරෝපය, ආසියාව සහ අප්‍රිකාව මුණ ගැසුණු මෙම ලක්ෂ්‍යයේ - මෙම කාලයේදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ජීවත් වී මියගොස් නැවත මළවුන්ගෙන් උත්ථානය වූ සේක. ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් උත්ථානවූයේ ඊශ්‍රායලයට පමණක් නොවේ, මනුෂ්‍ය වර්ගයාටමය.

"මම වනාහි භූමියෙන් ඔසවනු ලැබුවහොත් සියල්ලන් මා වෙතට ඇදගන්නෙමි. (යොහන් 12:32)

යෙරුසලමේදී, පුරාණ ලෝකයේ සන්දිස්ථානයේදී, සියලු දේශවල සහ සියලු කාලවල ජනතාවට සිද්ධිය තහවුරු කර ගැනීමට හැකිවීමට, ක්‍රිස්තුස්වහන්සේ කුරුසියෙහි "ඔසවනු ලැබුවෝය" පාවුල් කී පරිදි :

"මෙය මුල්ලකදී නොකළ බැවින්" (ක්‍රියා 26:26)

පළමුවෙනි සියවසේ දන්නා ලෝකය පුරා උන්වහන්සේගේ සාමයේ පණිවුඩය යෙරුසලමේ සිට රැගෙන යාමට හැකිවිය. යුදෙව්වන්ට මෙම සිද්ධිවල ඵලය වූයේ එක් පරම්පරාවකින් පසුව යෙරුසලම විනාශ වීමයි. යෙරුසලම කැරලි ගැසූ අතර, රෝම හමුදාව නගරය වටකොට ක්‍රි.ව. 70 දී එය පොළවටම ගිනිබත් කළෝය. දිවි රැකගත් යුදෙව්වන් ඔවුන්ගේ දේශයෙන් නෙරපන ලදුව, අහස යට සියලුම ජාතීන් අතර විසිරවිය. ඊලඟ වසර 1800 තුළ දේශය පාළුව තිබින.

## විසුරුවා හරින ලද දෙවියන්වහන්සේගේ රැළ

යුදාහි විනාශය ගැන පුරෝකථනය කළ එසකියෙල්, මෝසෙස්ගේ ව්‍යවස්ථාවට අනුව දිනපතා පූජා ඔප්පු කිරීම සඳහා අවශ්‍ය, යෙරුසලෙම වටා ඇති කඳුවල බැටළුවන් දර්ශණයකින් දිටීය. ඔහුගේ දර්ශණයේ (එසකියෙල් 34:2-31) මෙම බැටළුවන් ඊශ්‍රායලයේ ජනතාව ගැන උපමාවකි. කුලිකරුවන්ගේ අතහැරීමට බඳුන්ව, නායකයකු රහිතව, ඉබාගාතේ අයාලේ යමින් සිටිනා ලෙස එසකියෙල් ඔවුන් දුටුවේය. ඔහු බලා සිටිනා විට බැටළුවන් හට ඔවුන් හඳුනන කටහඬක් ඇසෙයි. බැටළුයෝ, නැතිවූ බැටළුවන් සොයා, තුවාල වූවන් සොයා පර්වත වලින් බැස උන් බේරාගත්, සත්‍ය එඬේරාණෝ අනුගමනය කිරීම සඳහා එක්ව දිවුවෝය. ඔහු උන්ගේ තුවාලවලට තෙල් වත්කර, බිඳුනු ගාත් බැන්දේය. උන්හට සෑහීමට කන්නටත් දිගාවී සිටීමටත් හැකි යහපත් තණබිම් කරා ඔහු උන් දැක්වූයේය. එබැවින් දෙවියන්වහන්සේ මෙසේ පවසනසේක් :

"ඔවුන් පෝෂ්‍ය කිරීමට එකම එඬේරෙක්වන මාගේ සේවකයාවූ දාවිත් නැගිටුවා ඔවුන් කෙරෙහි පත්කරන්නෙමි. හෙතෙම ඔවුන් පෝෂ්‍ය කොට ඔවුන්ගේ එඬේරා වනනේය........ මාගේ බැටළුවෝවන මාගේ ගොදුරු බිමේ බැටළුවෝ වූ නුඹලා වනාහි මනුෂ්‍යයෝය. මම නුමලාගේ දෙවියන්වහන්සේයැයි ස්වාමිවූ දෙවියන්වහන්සේ කියන සේක." (එසකියෙල් 34:23-31)

බොහෝ කළකට පසු "දාවිත්ගේ පුත්‍රවූ" යේසුස්වහන්සේ ගලීලයේ වෙරළ මත සිටි බොහෝ අය දැක "ඔවුන් එඬේරෙකු නැති බැටළුවන් මෙන් සිටිය බැවින් ඔවුන් කෙරහි අනුකම්පාකොට" (මාර්ක් 6:34) එම එලිමහන් ප්‍රදේශයේදී උන්වහන්සේ සමූහයාට ඉගැන්වූ අතර ඔවුන් පූප පහකින් සහ මසුන් දෙදෙනෙකුගෙන් පෝෂණය කලසේක. එම ක්‍රියාවේදී උන්වහන්සේ, එසකියෙල් අනාවැකි කී ලෙස ඊශ්‍රායලයේ සත්‍ය එඬේරාණෝ උන්වහන්සේ බැව් එළිදරව් කළසේක. මෙම ප්‍රාතිහාර්යය, ඊශ්‍රායලයේ සහ සියලු මිනිසුන්ගේ ගැලවීම සඳහා යේසුස්වහන්සේ කිරීමට යන මහා ක්‍රියාවක සුලු පූර්ව වින්දනයක් විය.

## නැවත එක්රැස් වීමේ බලාපොරොත්තුව

ඊශ්‍රායලයේ ඉරණම රූපණය කළ තවත් දර්ශන එසකියෙල් දුටහ. බොහෝ ප්‍රමාණයක් සහ බොහෝ වියලි අස්ථි වලින් පිරී මිටියාවතක් ඔහු දුටුවේය. ඔහුට අණකල ලෙස ඔහු අනාවැකි කී විට, ඒ අතර විශාල සෙලවීමක් වී අස්ථියෙන් අස්ථිය ඒවා එකතුවිය. ඊට පසු ඒවා නහර, මස් සහ හම්න් පිරී, ශරීර තුළට ශ්වසනය ඇතුලු වී, සජීවී ලෙස සිටගත් අතර, අතිමහත් සමූහයක් විය. දෙවියන්වහන්සේ මෙසේ ප්‍රකාශ කරන සේක.

"මාගේ සෙනඟනි, මම නුඹලාගේ සොහොන් විවර කොට, නුඹලාගේ සොහොන් වලින් නුඹලා නැගිටුවා නුඹලා ඊශ්‍රායල් රටට පමුණුවන්නෙමි..... නුඹලා ජීවත්වන ලෙස මා විසින් නුඹලා තුළ මාගේ ආත්මය තබා..." (එසකියෙල් 37:12,14)

ලී දෙකක් එකට සම්බන්ද කිරීම උතුරු සහ දකුණු රාජ්‍යයන්ගේ නැවත එකතුව නියෝජනය කරයි.

"ඒවා මගේ අතේ එකක් වෙන ලෙස ඒවා එක ලියක් කරන්නෙමි...... දේශයෙහි ඊශ්‍රායෙල් කඳු පිට ඔවුන් එක ජාතියක් කරන්නෙමි, එක රජකේද ඔවුන් සියල්ලන්ටම රජවන්නේය..... මාගේ මණ්ඩපයද

ඔවුන් වෙත වන්නේය. මම ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන්නෙමි. ඔවුහු මාගේ සෙනඟ වන්නෝය. (එසකියෙල් 37:19, 22,27)

විසිරී සිටින්නන්ගේ නැවත එකතුව සහ ඔවුන් දෙවියන්වහන්සේට සහ දේශයට අනුයුක්ත කිරීමේ තේමාව සියලු බයිබල් අනාවැකි තුළ පැතිරී ඇත.

"විසිරෙවූ තැනන්වහන්සේ ඔවුන් රැස්කර, එඬේරා තම රැළ ආරක්ෂා කරන්නාක් මෙන් ඔවුන් (ඊශ්‍රායලය) ආරක්ෂා කරණ සේක." (යෙරමියා 31:10)

යෙසායා මෙසේ පවසයි:

"ස්වාමීන්වහන්සේ විසින් නිදහස් කරන ලද අය ගී කියමින් සියොන්ට හැරී එන්නෝය. සදාකාල ප්‍රීතිය ඔවුන්ගේ ඉස්පිට තිබෙන්නේය." (යෙසායා 35:10)

මීකා තුළින් දෙවියන්වහන්සේ මෙසේ පවසයි:

"මම කොරගස ගසා යන්නන් ඉතුරුවෙන්ට සලස්වා, ඈත් කරනු ලැබූ අය බලවත් ජාතියක් කරන්නෙමි. ස්වාමීන්වහන්සේ සියොන් කන්දේ ඔවුන් කෙරෙහි මෙතැන් පටන් සදාකාලයටම රජකම් කරන සේක" (මීකා 4:7)

දෙවියන්වහන්සේගේ "පාලනය" භාෂාවේ හරඹයක් නොවේ. දිවැස්වරයාගේ සිතුවිල්ල තුළ එය දාවිත්ගේ හෝ සොලමන්ගේ විජිතය මෙන් සැබෑ බව අදහස් කරයි. ඔවුන්ගේ බලකොටුව පාලනයේ මධ්‍යස්ථානය වනු ඇත.

"එම්බා රැළේ කොත, සියොන් දුවගේ ගෙල නුඹ වෙතට පළමු ආණ්ඩුව එන්නේය. එසේය, යෙරුසලෙම් දුවගේ රාජ්‍යය එන්නේය." (මීකා 4:8)

"ඊශ්‍රායෙල්ට රාජ්‍යය නැවත පිහිටුවා දෙනු" ඇතැයි ගෝලයෝ යේසුස්වහන්සේගෙන් බලාපොරොත්තු වූහ. (ක්‍රියා 1:6) ක්‍රිස්තුස්වහන්සේ මෙම බලාපොරොත්තුව සහතික කළත් - එය වහාම නොවිය. (ක්‍රියා 1:7) එය අපෝස්තුලුවරුන් නැවත පැමිණි විට "දෙවියන්වහන්සේ ලෝකයේ පටන් ගැන්මේ සිට තමන්ගේ ශුද්ධවූ අනාගවක්තෘවරුන්ගේ මුඛයෙන් කියෙව්වාවූ සියලු දේ නැවත පිහිටුවනු" ඇතැයි කාලය සටහන් කළේය. (ක්‍රියා 3:21)

## ලෝකය සඳහා දෙවියන්වහන්සේගේ අභිප්‍රාය

එවන් ජාතික බලාපොරොත්තුවක් විශ්ව සුභාරංචියේ කොටසක් විය හැක්කේ එය මිනිසා සඳහා වූ දෙවියන්වහන්සේගේ පූර්ණ අභිප්‍රායේ කොටසක් වූ නිසා පමණි. මීකාගේ අනාවැකිය පෙන්වන්නේ ඊශ්‍රායල් විජිතය අලුත් ලෝකයක න්‍යෂ්ටිය වන බැවිය. ඊශ්‍රායල්යේ පාපයට දඬුවමක් වශයෙන්, යෙරුසලමේ දේව මාලිගයට පවා විනාශය පැමිණීම ගැන මීකා කතා කලේය. එතැන් සිට අඛණ්ඩව, ඔහු වඩා ඈත අනාගතයක් දෙස බලා විනාශයසේම සැබෑ ප්‍රතිසංස්කරණයක් දකියි.

> "නමුත් මතු දවස්වලදී ස්වාමින්වහන්සේගේ ගෘහය පිහිටි කන්ද, කඳුවල මුදුනේ පිහිටුවනු ලබන්නේය. හෙල්වලට වඩා උසස් වන්නේය. ජනයා එය කරා ගලාගෙන එන්නෝය." (මීකා 4:1)

එම වචනවල පද අර්ථය සහ රූපිකය අලංකාර ලෙස සංයෝග වීමක් ඇත. සියොන් කන්ද මත සැබෑ දේව මාළිගයක් තිබිය යුතුය. නමුත් කන්ද, භූගෝලීය ක්‍රියාවක් ඉක්මවා ගිය රූපයක් වූ කාව්‍යමය ආකෘතියක් වෙයි. එයට පහත් අනෙක් ජාතීන් සහ අධිරාජ්‍යයන්ය. වන්දනාවේ ලෝක මධ්‍යස්ථානය වෙත ආලෝකය සහ අවබෝධය සොයා පැමිණෙන්නේ දේශයන්හි ජනතාවයි.

> "බොහෝ ජාතීන්ද ගොස් කථාකොට : වරෙල්ලා ස්වාමින්වහන්සේ කන්දටත් යාකොබ්ගේ දෙවියන්වහන්සේගේ ගෘහයටත් යමු. උන්වහන්සේ තමන්ගේ මාර්ග ගැන අපට උගන්වනවා ඇත. අපිද උන්වහන්සේගේ මාවත්වල යන්නෙමු." (මීකා 4:2)

යෙරුසලමේ සිට නිකුත්වන්නාවූ "ස්වාමින්වහන්සේගේ වචනය" ට විරෝධය පාන ජාතීන් හට, තමන්ගේ යුධායුද සාමයේ උපකරණ ලෙස පරිවර්තනය කිරීමට බලකරනවා ඇත.

> "උන්වහන්සේ බොහෝ ජනයන් අතරේ විනිශ්චයකට, දුරින් සිටින බලවත් ජාතීන්ට තීන්දුව කියන සේක. ඔවුන් තමන්ගේ කඩුවලින් හී වැල්ද හෙල්ල වලින් දෑකැතිද තළා ගන්නෝය. ජාතියක් ජාතියකට විරුද්ධව කඩුව ඔසවන්නේවත් ඔවුන් තවත් යුද්ධය ඉගෙන ගන්නේවත් නැත" (මීකා 4:3)

ලෝක සාමය තහවුරු වී, බිය සහ කුසගින්නෙන් නිදහස් වීම පැමිණෙන්නේය.

"ඔවුනු කිසිවෙකුගෙන් භයක් නොලැබ, එකිනෙකා තම තමාගේ මිදිවැල යටද අත්තික්කා ගස යටද වාසය කරනවා ඇත." (මීකා 4:4)

## දිවැස්වරුන්ගේ පණිවිඩය

මෙය හුදකලා අනාගතවාක්‍යයක් නොවේ. දිවැස්වරුන්ගේ පණිවිඩයේ මූලිකම පදාර්ථය මෙයයි. අනාගතයේදී පිහිටුවනු ලබන මහිමාන්විත දේවමාලිගයේ විස්තරාත්මක දර්ශනයක් එසකියෙල් සතුව ඇත. වසරක් පාසා ජාතීන් එහි යැම සෙකරියා විස්තර කරයි.

"රජවූ සේනාවල ස්වාමින්වහන්සේට නමස්කාර කරන්නටත් කූඩාරම් මංගල්‍යය පවත්වන්නටත්" (සෙකරියා 14:16)

ඔහු මෙසේ ප්‍රකාශ කරයි:

"ස්වාමින්වහන්සේ මුලු පොළොව කෙරෙහි රජව සිටිනවා ඇත. ඒ කාලයෙහි ස්වාමින්වහන්සේ පමණක්ම දෙවිව සිටිනවා ඇත. උන්වහන්සේගේ නාමය පමණක්ම ඇතිවන්නේය." (සෙකරියා 14:9)

විශ්ව සාමයේ සහ විශ්ව වන්දනාවේ යුගය වූ දෙවියන් වහන්සේගේ මෙම පාලනය දෙස දිවැස්වරු එකිනෙකා බලාපොරොත්තුව සිටිත්. සියොන්හි රජතුමා විසින් ඍජුව පාලනය කරනු ලබන ඊශ්‍රායලයේ ප්‍රතිසංකරණය කරන ලද රාජධානිය එහි හදවත ලෙද සියලු දිවැස්වරු දකිත්-එම රජතුමා ගැන උපතේදී ප්‍රකාශ කරන ලද:

"උන්වහන්සේට යේසුස් යන නාමය තබාපන්න. උන්වහන්සේ උතුම්ව මහෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යැයි කියනු ලබනසේක. උන්වහන්සේගේ පියවූ දාවිත්ගේ සිංහාසනය දෙවිවූ ස්වාමින්වහන්සේ උන්වහන්සේට දෙන සේක. උන්වහන්සේ යාකොබ්ගේ වංශය කෙරෙහි සදාකාලේටම රජකම් කරන සේක. උන්වහන්සේගේ රාජ්‍යය කෙළවර නොවන්නෙය." (ලූක් 1:31-33)

## කුමන ආකාරයක ජනතාවක්ද?

මෙම ලෝක ව්‍යාප්ත අධිරාජ්‍යයේ ප්‍රධානතම ජාතිය සැදුම්ලනුයේ කිනම් ආකාරයේ ජනතාවකින්ද? නව ලෝක පිළිවෙලක දර්ශනයක්

මෙන්න - එය දේශපාලනික සත්‍යයකි, නමුත් අධ්‍යාත්මික පදනම් මත රැඳී ඇති නිසා ඊට වැඩියෙන් බලවත්ය. ලෝක ගෝලය මත මෙම පිළිවෙල දිග හැරීමේ නාෂ්ටිය වනුයේ තම දේශයට නැවත පිහිටුවනු ලැබූ ඊශ්‍රායල් ජනතාවයි. නැවත නැවතත් පිළිම වන්දනාවට හැරී ගිය, ආරම්භයේ සිටම "තද කුළල්" ඇති (නික්මයාම 32:9) ජනතාවක් ලෙස අපි ඔවුන් හඳුනමු.

පසු කාලයේදී, පිළිම වෙනුවට හිස් ස්වයංධාර්මිකත්වයක්, සැදැහැවත්කම සේ වෙස් වලාගත් ස්වයංවන්දනාවක් ලෙස ආදේශ කොට, ආගමික දුරාචාරය තුළින් නපුරේ පත්ලටම බැස ඔවුන්ටගම එඬේරාණෝ සහ මෙසායා කුරුසිගත කිරීමට තරම් හැකි වූ අය ලෙස අපි ඔවුන් දකිමු.

මනසින් සහ චරිතයෙන් නිතරම උතුම්, අසීමිත දුක් වේදනා විඳින මිනිසුන් ලෙස අපි අද ඔවුන් හඳුනමු. නමුත් සමහර විට, සියවස් ගණනාවක් තුල පීඩාවට ලක් වීමේ ප්‍රතිපලය ලෙස අප්‍රසන්න භාවයක්ද ඇත. ඔවුන් එසේ නොවන්නේ කෙසේද? නිවහනක් නොමැතිව විසිරී, තමන් ජීවත් වූ ජාතීන් අතර වෙන් කරන ලදුව, පාසැල් සහ රැකියාවලින් විවක්ෂණය කරන ලදුව, බොහෝ අවස්ථාවල නෛතික අයිතිවාසිකම්ද ප්‍රතික්ෂේප කරන ලදුව හුන් බැවිනි.

1948 සිට, මැද පෙරදිග ප්‍රධාන ආර්ථික සහ දේශපාලනික බලයක් ලෙස නව විශ්වාසයක් උපයා ගනිමින්, කාන්තාරය පුෂ්පයන්ගෙන් පිබිදු, නැවත වරක් ඊශ්‍රායල් රාජ්‍යය ලෙස අපි ඔවුන් දකිමු. එහි සේවයට ප්‍රාණවත් භාවය සහ චරිත ශක්තිය ගෙනෙමින්, පොළවට බැඳීම් ඇති සජීවී සමාජ සමඟ සමම්බන්දව සමාජ අත්හදාබැලීම් වලට නව ප්‍රමිති තබමින් සිටිනා බැව් අපි දකිමු. විද්‍යා සහ විවිධ කලා සංවර්ධනය අධ්‍යයනය කරමින් එකට එකතු වී සිටිනා ජනතාවක් ලෙස අපි ඔවුන් දකිමු.

## <u>යුදෙව් පුනරුදය කලින් දැන්ගත්හ.</u>

පලස්තිනයේ මෙම පුනරුදය තුළ, බයිබල් ශිෂ්‍යයෝ පුදුමාකාර අනාගත වාක්‍ය ඉටුවීමක් දකිති. නමුත් නූතන ඊශ්‍රායල් රාජ්‍යයේ සැකැස්මට වසර සියයකට කලින්, ඊශ්‍රායලයේ නැවත එකතු වීම විශ්වාස කල හෝ දේශනා කල බයිබල් අනාවැකි ශිෂ්‍යයෝ සිටියේ ඉතා සුලු ප්‍රමාණයකි. මොවුන් අතර පළමු ක්‍රිස්ටඩෙෆියන්වරු (උදා:- ජෝන් තෝමස් "එල්පිස් ඊශ්‍රායල්" 1848, iii කොටස, vi පරිච්චේදය) සහ දෙවියන් වහන්සේගේ ජනතාව නැවත එකතුවීමක් ගැන බලාසිටි අනෙකුත් අය වූහ.

එමනිසා 1917 නොවැම්බරයේ, පලස්තිනය යුදෙව්වන්ගේ ජාතික වාසස්ථානයක් ලෙස බ්‍රිතාන්‍ය ප්‍රතිපත්තිය බැල්ෆෝර් ප්‍රකාශය මගින් ප්‍රකාශ කල විට, ලෝකය පරා වූ අනාගත වාක්‍යය විශ්වාස කරන්නවුන් ඔවුන්ගේ ඇස් පනාපිටම යුගයයන් තුළවූ දෙවියන්වහන්සේගේ අභිප්‍රාය ඉටුවීමේ ප්‍රබල තහවුරුවීමකින් ප්‍රමෝදයට පත්විය.

ඉන්පසු පැමිණි වර්ෂවල අයාලේ ගිය දහස්ගණනකගේ නැවත පැමිණීමත්, දේශයේ සශ්‍රීකභාවය ප්‍රකෘතිමත් කිරීමේ සාර්ථකභාවයත්, ජාතික රාජ්‍යයක් වශයෙන් ඊශ්‍රායලයේ පිබිදීම සමඟ නැවත වැඩුනු ජාතික අනන්‍යතාවයත් දුටහ. මේ සැම ඉසව්වකදීම බයිබල් කියවන්නන් අනාගත වාක්‍ය ඉටුවීම දකී. එසකියෙල් 37 දී මෙන්, ඉතා පැහැදිලිව, ඊශ්‍රායයලයේ වියලි අස්ථි එකතු වීම සහ ඒවා මතුපිට නහර සහ මාංශය වැඩීමය.

නමුත් මෙම අනාගත වාක්‍යය විශ්වාස කරන්නන්, යුදෙව් ව්‍යාපාරය ගන්නා ලද ලෞකික ස්වභාවය ගැන මුලාවී නොසිටියහ. සියොන්වාදී මුදුන්පත් කර ගැනීම් උත්කර්ෂවත් වූවද, දෙවියන්වහන්සේ වෙනුවට බොහෝ අය තුළ විශ්වාසය ඇත්තේ ඔවුන් තුළම සහ ජාතික අනාගතය තුළත්ය. මෙතෙක් දුරට සියොන්වාදී ව්‍යාපාරය ප්‍රධානකොටම මනුෂ්‍ය සාරයේ ජයග්‍රහණයක්ය. එසේ නම්, අධ්‍යාත්මික ලෝක සැලැස්මක නෂ්ටිය වීම සඳහා යොදා ගැනෙන්නේ මොවුන්ද?

## ඊශ්‍රායලයේ ප්‍රතිසමාදානය

පිළිතුරු සෙවීම සඳහා අපි අනාගත වාක්‍යයන් ගැඹුරට හැදෑරිය යුතුවෙමු. භයානක ලෙස වටලන ලද නගරයේ - ඔවුන්ගේ අගනුවර- ඔවුන් නැවත තමුන්ගේ දේශයේ එකතුවූවාට පසු, නැවත වරක් දරුණු වැටලීමේ වේදනා විඳින ජනතාවගේ චිත්‍රයක් සෙකරියා දෙනු ලබයි. නැවත වරක්, ක්‍රි.ව. 70 වේ ටයිටස් සිට 1943 වෝර්සෝ මුඩුක්කුවල සටන සහ 1948 සහ 1967 අරාබි ඊශ්‍රායල් යුද්ධවලදී මෙන් ඔවුන් විශේෂිතවූ නිර්භීත කමින් සටන් කරනු ඇත.

නමුත් ඔවුන් සතුරන් පරාජය කරනුයේ තමන්ගේ ශක්තිය තුළින් නොවේ, එය ස්වාමීන්වහන්සේගේය:

> "යෙරුසලමට විරුද්ධව එන සියලුජාතීන් විනාශකරන්නට සොයන්නෙමි" (සෙකරියා 12:9)

යේරුසලමේ "බරවූ ගල" ඔසවාගෙනඉවත් කරන අය

"බොහෝසේ තුවාල ලබන්නෝය. පොළවේ සියලු ජාතිහුද ඊට විරුද්ධව රැස්වන්නේ " යයි (3 පදය) තීරණය කරනු ලබන්නේ දෙවියන්වහන්සේය. මක්නිසාද, ස්වාමීන්වහන්සේ මෙසේ පවසන සේක.

> "ඒ කාලයෙහි මම සියලු අශ්වයින්ට කුල්මත්කමද, අසරුවන්ට උමතුකමද පැමිණ වීමෙන් පහර දෙන්නෙමි" (4 පදය)

සේනාවල ස්වාමීන්වහන්සේගේ නියෝජිතයා වන ඔවුන්ගේ මිදුම්කරු ක්‍රිස්තුස්වහන්සේ දෙස ඔවුන්ගේ ජයග්‍රාහී පැයේ ප්‍රීතියේදී ඔවුන් බලනු ලබන බැව් දිවැස්වර සෙකරියා පවසයි.

> "ඔවුන් තමුන් විසින් ඇන්නාවූ තැනැත්තාවන මා දෙස බලා සිට, එකම පුත්‍රයෙකු ගැන වැලපෙන්නාක් මෙන් උන්වහන්සේ ගැන වැලපෙනවා ඇත. කුලුඳුලා ගැන ශෝකවන්නාක් මෙන් උන්වහන්සේ ගැන ශෝක වෙනවා ඇත." (සෙකරියා 12:10)

ඔවුන්ගේ ශෝකය සමඟ ලැජ්ජාව මුසුවී, දුකේදී පවා ඔවුන්ගේ සහකාරත්වය සොරා ගෙන, "වංශ පෙළපත වෙනම සහ ඔවුන්ගේ භාර්යාවෝ වෙනමද" ශෝක වෙනවා ඇත. (සෙකරියා 12:12)

## අධ්‍යාත්මික කූටප්‍රාප්තිය

ඊශ්‍රායල් ඉතිහාසයේ අධ්‍යාත්මික කූටප්‍රාප්තිය එයයි. මිසරයේ වහල් භාවයෙන් දෙවියකන්වහන්සේගේ බලයෙන් ඉවතට ගෙනාවූ ඔවුන් හට, තමන්ගේ ජාතික ඉතිහාසය ආරම්භයේදී "ජීවනය සහ මරණයද, ආශිර්වාදය සහ ශාපයද" යන තෝරාගැනීම් වලට මුහුණ දීමට සිදුවිය. (ද්විතිය කථාව 30:19) දෙවියන්වහන්සේගෙන් වෙන් වූ මාර්ගයක ගමන් කල ඔවුන් මතුපිට ද්විතිය කථාවේ 28 පරිච්ඡේදයේ මෝසෙස් විසින් දුන්නාවූ ව්‍යවස්ථායික වට්ටෝරුවේ විනිශ්චයන් ලැබුණි.

> "ස්වාමීන්වහන්සේ උමතුකමද, අන්ධකමද, විස්මිත භාවයද යන මේවායින් නුඹට පහර දෙන සේක. අන්ධයා අඳුරෙහි අතගගා යන්නාක් මෙන් නුඹ ඉර මුදුන් වේලාවෙහි අතගගා යන්නෙහිය. නුඹේ මාර්ග වලදී නුඹ සවල නොවන්නෙහිය. නුඹ ගළවන්නට කිසිවෙකු නැතිව නුඹ නිරන්තර පීඩාවට හා කොල්ලයට ගොදුරු වන්නෙහිය." (28-29 පද)

"ස්වාමීන්වහන්සේ නුඹ පමුණුවන්නාවූ සියලු ජනයන් අතුරෙහි

නුඹ මවිතයට හේතුවක්ද, උපමාවක්ද, නින්දා කීමක්ද වන්නෙහිය." (37 පදය)

"සියලු දේ පුරාම තිබෙද්දී, නුඹ ප්‍රීතියෙන්ද, සිත් සන්තෝෂයෙන්ද, නුඹේ දෙවි වූ ස්වාමීන්වහන්සේට සේවය නොකළ නිසා, ස්වාමීන්වහන්සේ නුඹට විරුද්ධව එවන්නාවූ නුඹේ සතුරන්ට නුඹ විසින් බඩගින්නද, පිපාසයද, නිර්වස්ත්‍රකමද, සියල්ල ගැන හිඟකමද ඇතුව සේවය කරනවා ඇත. ඔවුන් නුඹ විනාශකර දමන තුරු යකඩ වියගහක් නුඹේ කරේ තබනවා ඇත. (ද්විතීය කථාව 28:47-48)

## ඔවුන්ගේ දුක්විඳීමේ කතාන්තරය

සියලු බියකරු කම්න් යුතුව මෙම අනාවැකි සම්පූර්ණ වීම සියවස් තුළ විහිදා දැක්වී ඇත. බැබිලෝනියට පිටුවහල් කිරීමත් පසුව යුදෙව්වෝ අන්තියෝකස් එපිෆානස් යටතේ පීඩාවට පත්වීමට නැවත පැමිණි අතර, එයට විරුද්ධව මැකබී පවුලේ නායකත්වයෙන් යුත් කැරැල්ලක් ඇති විය. එයින් පසු ඇති වූ යුදෙව් හැස්මෝනියන් රාජ්‍යය පළමුව රෝම පාලනයට මිත්‍රවද, පසුව ගණුදෙනුකරුවෙක් ලෙසද, අවසානයේ යටත්වද සිටියේය. පසුව ක්‍රි. ව. 70 දී වටලෑමේ බියකරුකම තුළින් යෙරුසලමේ විනාශයත් සමඟ යුදෙව් ජාතික ජීවිතය අවසන් විය.

රෝමානු අධිරාජ්‍යය තුළ විසිරුණු යුදෙව්වෝ, නමින් ක්‍රිස්තියානි වූ නමුත් ක්‍රියාවෙන් කලින් සිටි මිත්‍යා විශ්වාසික රෝමානු අධිරාජ්‍යයන් මෙන්වූ කොන්ස්ටන්ටයින් ගේ සිට අධිරාජ්‍යයන් යටතේ දුක්ඛිතව පීඩාවට පත්වූහ. ඉස්ලාමයේ වැඩීමත් සමඟ, අරාබි පාලනයක් යටතේ වූ දකුණු ස්පාඤ්ඤයේ බොහෝ යුදෙව්වෝ පිළිසරණ ලදහ. කතෝලික රජවරුන් විසින් නැවත ස්පාඤ්ඤය යටත් කරගන්නා තුරු ඔවුහු කෝර්දෝව අධ්‍යාපනයේ මධ්‍යස්ථානයක් කල අතර, පසුව යුදෙව්වන් සම්සෂණයේ වධයට භාර දෙන ලදි.

උන්වහන්සේගේ යුදෙව් ඥාතීන් මත වධහිංසා පැමිණවීම යේසුස්වහන්සේට ගෞරව දැක්වීමක් ලෙස සිතූ කුරුස යුද්ධය කරුවන් විසින් යුරෝපයේ සහ මැදපෙරදිග ඔවුන් සමූල ඝාතනය කරන ලදී.

ක්‍රිස්තියානි දරුවන්ගේ රුධිරය ඔවුන්ගේ චතාවත්වල යොදාගන්නේ යැයි ජාතිවාදී චිත්තවේගය විසින් චෝදනා කරන ලදුව, මධ්‍යකාලීන යුරෝපය පුරා ඔවුන් හුහුබඳින ලදී. අව්වාර බියෙන් යුත්

යුරෝපියයන් හට ඔවුන් සෑම විනාශියකටම ආදේශ කල හැකි එක්තරා යක්ෂ මිත්‍යාවක් විය. අලුත් පරම්පරාවන්ගේ සෑම දුෂ්ඨ චෝදනාවක් සමගම, ලේ පිපාසිත රංචුවල ප්‍රචණ්ඩත්වයට ඔවුන් ගොදුරු විය.

දහනව වන සියවස තුළදී සාර් රුසියාවේ වෛර ව්‍යාපාර (පොග්රොම් යැයි හැඳින්වූ) වලට යුදෙව්වන් යටත් වූ අතර, එය බිස්මාර්ක්ගේ ජර්මනියේදී සෙමිටික් විරෝධී විය.

හිට්ලර් සහ නාසීන් විසින් යුදෙව් ජාතිය සමූල ඝාතනය කිරීමේ ප්‍රයත්නය විසිවන සියවස් මනුෂ්‍යය වර්ගයාගේ අඳුරුතම අවස්ථාව ලෙස දුටුවේය. පළමුව යුදෙව්වන් හට ඔවුන්ගේ ජීවන වෘත්තීන් අහිමිකොට යුරෝපයේ සිට අයිස්ලන්තය පටන් චීනය දක්වා සියලු දේශයන්හි ඔවුන් සරණාගතයන් ලෙස එලවා දැමූ අතර, සරණ පතා පැමිණි සෑම රටකම යුධ ප්‍රවාහයන් සහ පීඩා කිරීම් වලට මුහුණ දී, දිවා රාත්‍රී බියෙන්, දරුවන් දෙමාපියන්ගෙන් සහ භාර්යාවන් ස්වාමිපුරුෂයගෙන් වෙන් කර - බොහෝ අය භීෂණයේ අවසාන පත්ලේම තම කතාවේ අවසානය සනිටුහන් කළෝය. එය ඕස්විට්ස් සහ ට්‍රෙබ්ලින්කාහි ගෑස් කුටිර තුළ විය. 1933-45 දක්වා කාලය තුළ අඩු තරමින් යුදෙව්වෝ 6,000,000 ක් මිය ගියෝය. සෑම යුරෝපීය යුදෙව්වන් තුන්දෙනෙකුගෙන් දෙදෙනෙකුම අහිංසක මිනිසුන්, ස්ත්‍රීන් සහ දරුවන් - ඝාතනය කර තිබුනි.

## ඔවුන් ලුහු බැඳ ආ ප්‍රේමය

එහෙත් එම ශෝකාන්විත ඉතිහාසය මුලුල්ලේම දෙවියන් වහන්සේගේ ප්‍රේමය ඔවුන් පසු පස පැමිණ ඇත. එය ඔවුන් ඉවත නොදමන ප්‍රේමයක් විය.

> "ඊශ්‍රායෙල් බාලව සිටි කල මම ඔහුට ප්‍රේම කොට, මාගේ පුත්‍රයාවූ ඔහු මිසරයෙන් කැඳවා ගතිමි" (හොසෙයා 11:1)

> "එප්‍රයිම්, මම කෙසේ නුඹ අත්හරින්නෙම්ද? ඊශ්‍රායෙල්, නුඹ කෙසේ පාවා දෙන්නෙම්ද?...... මාගේ බලවත් අදහස ඉෂ්ඨ නොකරන්නෙමි, එප්‍රායිම් නැවත විනාශ නොකරන්නෙමි. මක්නිසාද මම මනුෂ්‍යයෙක් නොව දෙවියන්වහන්සේය. නුඹලා අතරෙහි සිටින ශුද්ධ තැනන්වහන්සේය" (හොසෙයා 11:8-9)

නමුත් ඔවුන්ගේ වේදනාව - යුගයෙන් යුගයට ඇදීගිය ශරීරයට සහ අධ්‍යාත්මයට වූ වේදනාව ඔවුන් තමන්වහන්සේ වෙතට ගෙන ඒමට

ගෙවිය යුතු දෙවියන්වහන්සේගේ මිදීමේ මිළ වන්නේය. උන්වහන්සේ සමඟ එකත්වය සඳහා මිනිස් හදවතේ දැඩි බව බිඳීමේ උන්වහන්සේගේ ක්‍රමය එයවන්නේය. දෙවියන්වහන්සේ පැවසූ පරිදි :

> "එසේය සදාකාල ප්‍රේමයකින් නුඹට ප්‍රේමකලෙමි. එබැවින් දයාබරකමින් නුඹ ඇදගතිමි" (යෙරමියා 31:3)

අවසාන අර්බුදයේදී දේශයට නැවත පැමිණීමෙන් සහ නැවත ගොඩනැගීමෙන් පසු ඔවුන්ගේ බලාපොරොත්තු නැවතත් සුනුවිසුණු වී යන්නේ යැයි පෙනෙනා විට, ඔවුන් පසු පස ආ දිව්‍යමය ප්‍රේමය ඔවුන් පසුකර ඔවුන් මුදනවා ඇත. එම මිදීමේ අවස්ථාවේදී එම ප්‍රේමය ඔවුන් ඉදිරිපිට යේසුස්වහන්සේ ලෙස අන්තර්ගතව පුද්ගලකරණය වී සිටිනවා ඇත. උන්වහන්සේට මෙසේ පැවසිය හැකි විය. "මා දුටු තැනැත්තේ පියාණන්වහන්සේ දුටුවේය" (යොහන් 14:9)

ඇනින ලද ක්‍රිස්තුස්වහන්සේ යුදෙව්වන් දක්නා දවස පැමිණෙන විට (සෙකරියා 12:10 බලන්න) උන්වහන්සේගේ අත්ල මත ඇති ඇණ සලකුණු වලින්, ඔවුන්ගේ මුතුන්මිත්තන් "ඔහුගේ ලේ අප පටද අපගේ දරුවන් පිටද වේවා" (මතෙව් 27:25) යැයි කී නාසරෙත්හි යේසුස්වහන්සේ ප්‍රබල සංවේගයකින් හඳුනාගන්නවා ඇත.

## <u>හදවතින් නිහතමානී වන්නෝ</u>

එම අවසන් හද සසල කරන හඳුනා ගැනීමේදී දෙවියන්වහන්සේ ඉදිරියේ ඔවුන් තමන්ගේ සම්පූර්ණ අසරණ භාවය තේරුම් ගන්නවා ඇත. උන්වහන්සේ ඉදිරියේ සිටීමට තමුන්ගේම ධර්මිෂ්ඨභාවයක් ඔවුනට නොමැති වනු ඇත. ලැජ්ජාව හැර කිසිවක් ඔවුනට නොමැති වනු ඇත. එම දැවෙන අවබෝධයන් සමඟ ඔවුන්ගේ හදවතෙහි දැඩිබව දියැවී ගොස් ඔවුන්ගේ මිදීම පැමිණෙන්නේය. මක්නිසාද :

> "දෙවියන්වහන්සේට කලයුතු පූජානම් බිඳුනාවූ සිතක්ය. දෙවියන් වහන්ස, බිඳුනාවූ, තැලුනාවූ සිතක් ඔබ සුළුකොට නොසිතන සේක." (ගීතාවලි 51:17)

දෙවියන්වහන්සේගේ අපරිමිත ක්ෂමාව තුළ මිස වෙනත් පිළිසරණක් නොමැති බැව් ඔවුන් දැනගන්නා විට , දෙවියන්වහන්සේ:

> "දාවිත්ගේ වංශය කෙරෙහිද, යෙරුසලෙම් වැසියන් කෙරෙහිද කරුණාවේ හා කන්නලව් කිරීමේ ආත්මය වගුරුවන" සේක. (සෙකරියා 12:10)

තවත්:

> "පාපය සහ අපවිත්‍රකම සඳහා දාවිත්ගේ වංශයටද යෙරුසලමේ වැසියන්ටද උල්පතක් ඇරී තිබෙන්නේය." (සෙකරියා 13:1)

අන්‍යජාතීන් මෙන් යුදෙව්වන්ද, ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසියෙන් බෞතිස්මය තුළින් පාපවලට ක්ෂමාව ලද යුතුය.

ඊශ්‍රායලය පිට සිටින යුදෙව්වන් හට ස්වාමින්වහන්සේ කියනසේක්: "ඔවුන් ඇඬීමද කන්නලව්ද ඇතුව එනවා ඇත. එලෙස ඔවුන් ගෙන්නෙමි. වතුර ඔයවල් ළඟටද නොපැකිලෙන්නාවූ ඇද නැති මාර්ගයකද ඔවුන් ගෙනයන්නෙමි. මක්නිසාද මම ඉශ්‍රායෙල්ට පිය කෙනෙක් වී සිටිමි. එප්‍රායිම්ද මාගේ කුලුඳුලාය. (යෙරමියා 31:9)

## වචනය සඳහා ගුරුවරයෝ

දැන් නිදහස් කර ගන්නා ලද, සුවවූ, නැවත ස්ථාපිත කරන ලද සහ ක්ෂමාව ලද ඔවුන්ගේ ඉපැරණි දේශයේදී "ඔවුන්ගේ ආත්මයද ජලසම්පන්න උයනක් මෙන් වන්නේය, ඔවුහු තවත් කිසිසේත් මලානික නොවන්නෝය." (යෙරමියා 31:12)

එම දවසේ ප්‍රීතිය සහ ආශිර්වාදය විත්‍රයට නැංවීමට දිවැස්වරු භාෂාවක බල පැවැත්විය හැකි සියලුම අලංකාර රූප සංඥා යොදා ගනිමින් "වනාන්තරයද වියළි දේශයද ප්‍රීතිවන්නේය, කාන්තාරය ප්‍රීතිමත් වී සෙව්වන්දි මෙන් මල් දරන්නේ"යැයි පවසයි. (යෙසායා 35:1)

එසේත් නැත්නම් දේශයට කී පරිදි:

> "මක්නිසාද තරුණයකු විසින් කන්‍යාවක් පාවාගන්නාක් මෙන් නුඹේ පුත්‍රයෝ නුඹ සරණපාවා ගන්නෝය. මනමාලයා මනමාලි කෙරෙහි ප්‍රීතිවන්නාක් මෙන් නුඹේ දෙවියන්වහන්සේ නුඹ කෙරෙහි ප්‍රීතිවන සේක." (යෙසායා 62:5)

නමුත් සියලු ලෞකික ආශිර්වාදයන් සහ උන්වහන්සේගේ ලෝකව්‍යාප්ත රාජධානියේ හදවත වූ දෙවියන්වහන්සේගේ තෝරාගත් පාලන තත්වයේ සියලු මහිමය, අධ්‍යාත්මික පරිවර්තනයක ප්‍රකාශනය සහ ප්‍රතිඵලයද වන්නේය. මේ සියල්ල පැමිණෙන්නේ ප්‍රේමය සඳහා වූ දීර්ග සහ අතිමහත් ලුහුබැඳයාම ආවසානයේදී ඔවුන් තමන්වද

දෙවියන්වහන්සේවද දැනගැනීමට පැමිණෙවීමත්, එම දැනීමෙන් ඔවුන්ගේ ඉරණම ඉටුවීමටත්ය. එවිට ඔවුන් දෙවියන්වහන්සේගේ ජනයා වන අතර උන්වහන්සේ ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන්නේය. අවසානය කරා ළඟා වීමෙන් ඔවුහු ලෝකයට ආලෝකයේ උල්පතක් වන්නෝය. දෙවියන් වහන්සේ මෙසේ පවසන සේක:

"ඒ දවස්වලදී සියලු භාෂා ඇති ජාතීන්ගෙන් මනුෂයන් දසදෙනෙක් වස්ත්‍රකොන අල්ලාගෙන, එසේය යුදෙව් ජාතියේ මනුෂයෙකුගේ වස්ත්‍ර කොන අල්ලාගෙන - අපි නුඹලා සමඟ යන්නෙමුව. මක්නිසාද දෙවියන්වහන්සේ නුඹලා සමඟ සිටින බව අප විසින් අසා තිබේ. (සෙකරියා 8:23)

## උන්වහන්සේගේ නාමය වෙනුවෙන් දෙවියන්වහන්සේගේ ක්‍රියාව

"ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියන සේක:...... එම්බා ඊශ්‍රායෙල් වංශය, නුඹලා නිසා නොව.....මාගේ ශුද්ධ නාමය උදෙසා ක්‍රියා කරමි." (එසකියෙල් 36:22)

ඔවුන් ගැලවුයේ ඔවුන්ගේ ඇති කිසිම දැහැමි බවක් නිසා හෝ ඔවුන් සෙසු මනුෂ්‍යවර්ගයාට වැඩියෙන් දඬුවම් ලැබුයේ වැඩියෙන් දුෂ්ඨ නිසා හෝ නොවේ. ඔවුන් තුළ උන්වහන්සේගේ මාර්ග වල මහත් භාවය මිනිසාට ප්‍රකාශ කිරීමට දෙවියන්වහන්සේ ඔවුන් මනුෂ්‍ය වර්ගයාගේ උදාහරණයක් ලෙස ගෙන ඇත.

"නුඹලා මාගේ සාක්ෂිකාරයෝව මා විසින් තෝරාගත් මාගේ මෙහෙකරුවාට සිටින්නාහු යැයි ස්වාමින්වහන්සේ කියනසේක." (යෙසායා 43:10)

ඔවුන්ගේ අනාගතය විස්තරාත්මකව කියූ දෙවියන්වහන්සේගේ ඥානයේ සහ බලයේ සජීවී සාක්ෂිකාරයෝ යුදෙව්වෝ වන්නෝය. උන්වහන්සේ මෙසේ කී පරිදි, ඔවුහු දෙවියන්වහන්සේගේ විශ්වාසවන්ත බවේ සාක්ෂිකාරයෝ වන්නෝය. "නුඹ තින්දුවටම නැති නොකරන්නෙමි" (යෙරමියා 30:11), එසේ පුරාණ අධිරාජ්‍යයන් සිහිනයක් සේ පහව් ගියත්, ඔවුහු ඉතිරි වන්නේය.

නමුත් ඒ සියල්ලටම ඉහලින්, මිනිසාගේ නිදහස් කැමැත්ත විනාශ නොකොට, මනුෂ්‍යය වර්ගයා උන්වහන්සේ සමඟ ඒකත්වයට නැවත රැගෙන යාමේ දෙවියන්වහන්සේ සඳහා වූ මිළ ගැන ඔවුහු සාක්ෂිකාරයෝ

වන්නෝය. ඔවුන්ගේ මී මුත්තන්ගේ නාමයෙන් ආදරයට පාත්‍ර වූ මෙම මිනිසුන් නෙරපීමට සහ දඬුවම් කිරීමට ඝෝරවූ උපකරණ ලෙස හිංසාව පාවිච්චවි කිරීම ස්වර්ගයේ පියාණන් හට පහසු නැත. ඔවුන්ද අනෙක් සියලු මිනිසුන් මෙන් අවසානයේදී ගලවාගත හැක්කේ දෙවියන්වහන්සේගේ උත්තරීතර දීමනාව වූ උන්වහන්සේගේ ආදරණීය පුත්‍රයා තුළින් වන අතර, ඒ මිනිසුන් උන්වහන්සේ තුළ විනාශ නොවන ලෙසය.

## අන්‍යජාතිකයන්ගේ වගකීම

ක්‍රිස්තුස්වහන්සේ කුරුසිගත කලේ යුදෙව්වන් පමණක් නොවේ. යුදෙව්වන් සහ රෝමානුවන් එකතුවත් නොවේ. එය සියලු මනුෂ්‍යය වර්ගයාය. ජීවනයේ කුමරා මැරීමට කුමන්ත්‍රණය කළේ අප සියල්ලම දරා සිටින මිනිස් ස්වභාවයයි. දෙවියන්වහන්සේගේ අභිප්‍රාය ඉටු වීම සඳහා ක්‍රිස්තුස්වහන්සේ මිය යාමට අවශ්‍ය වූයේ මිනිස් ස්වභාවය නිසාය. ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ කුරුසිය සමඟ අප අනන්‍යකරන බෞතිස්මයෙන් සෝදා හරින තුරු ක්‍රිස්තුස්වහන්සේගේ මරණයේ පැල්ලම අපි සියල්ලෝම දරන්නෙමු.

අපි යුදෙව්වන් හා සමාන වන්නෙමු. අප සතුටු වුවත් නැතත්, මිනිස් ස්වභාවය එහි සියලු අඳුරත් සමඟ අපි ඔවුන් සමඟ බෙදාගන්නමෙු. නමුත් අප කැමති නම්, දෙවියන්වහන්සේගේ අභිප්‍රායේ ස්ථානයක් ඔවුන් සමඟ බෙදා ගන්නට අපට හැකිය.

දෙවියන්වහන්සේ ගැන දැනුම යුදව්වන් තුළින් පැමිණෙන නිසා "ගැළවීම යුදෙව්වරුන්ගේ" යැයි කීවේ යේසුස්වහන්සේය. මනුෂ්‍යයන් සඳහා උන්වහන්සේගේ එළිදරව්වට උපරකණයක් ලෙස ඔවුන් දෙවියන් වහන්සේම විසින් සැලසුම් කරන ලදී. (රෝම 9:4-5 බලන්න.)

උන්වහන්සේගේ වචනයේ ආරක්‍ෂකයන් යුදෙව්වන් කිරීමෙන් දෙවියන්වහන්සේ එම අවස්ථාවේදීම ආබ්‍රහම් සහ ඔහුගේ බීජය, යේසුස්වහන්සේ, තුළින් සෑම ජාතියටම ආශිර්වාදය රැගෙන එන්නාවූ පොරොන්දුවේ භාරකරුවන්ද ඔවුන් කලසේක.

ආබ්‍රහම්ට දෙන ලද පොරොන්දුව තුළ සදාකාල ජීවිතයේ බලාපොරොත්තුවද බැඳී ඇත්තේ, ජීවිතයේදී ඔහුට අයත්කර ගැනීමට නොහැකි වූ දේශය ලබා ගැනීමට, ඔහු නැවත මළවුන්ගෙන් නැගිටවිය යුතු නිසාය. එම බලාපොරොත්තුවේ පංගුකාරයන් වීමට කැමැත්තෝ

ආබ්‍රහම්ගේ බීජයට බෞතිස්මය මගින් පොරොන්දුවේ පංගුකාරයන් විය යුතුය. (ක්‍රියා 7:5, හෙබ්‍රෙව් 11:19, 39-40, ගලාති 3:26-29 බලන්න.)

## මුලු ඊශ්‍රායල් ගලවනු ලබන්නේය.

එම බලාපොරොත්තුව සමඟ අන්‍යජාතීන්ගේ හවුල් වීම යුදෙව්වන් විසින් ඔවුන්ගේ මෙසොයා ප්‍රතික්ෂේප කරනු ලැබීම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් දෙවියන්වහන්සේ විසින් ඔවුන් ඉවත හෙලූ නිසා විවෘතවූ බැව් සත්‍ය කරුණකි. නමුත් පාවුල් පවසන්නේ :

> "මක්නිසාද ඔවුන් අත්හැර දැමීම ලෝකයා සමගි කිරීම නම්, ඔවුන් පිළිගැනීම මළවුන් කෙරෙන් ජීවනය මිස වෙන කුමක්ද?" (රෝම 11:15)

පාවුල් ඊශ්‍රායල් ජනතාව සසඳන්නේ ශාඛා කඩා දමා, ඒ වෙනුවට වල් ඔලිව ශාඛා බද්ධ කරන ලද, ඔලිව ගසකටය. නමුත් බද්ධ ශාඛා විසින් මුල් දරන්නේ නැති අතර මුල් විසින් ශාඛා දරනු ලබත්. දැන් ඔවුන්ගේ තත්වය දෙවියන්වහන්සේ කෙරෙහි නිහතමානී විශ්වාසයකට ණයගැති අතර, එම විශ්වාසය ප්‍රතික්ෂේප කරන ලද ශාඛා නැවත ප්‍රතිස්ථාපනය කරන බවට සහතිකයක් වනු ඇත. මක්නිසාද, "මුලු ඊශ්‍රායෙල් ගලවනු ලබන්නේය." (රෝම 11:24-26)

## දිව්‍යමය නාටකය

වේදිකාවේ ශෝකාන්ත නාටකයක අභිප්‍රාය, අනුකම්පාව සහ භීෂණය මගින් නරඹන්නන්ගේ උද්වේගය පහකර හැරීම බැව් ග්‍රීක කවියෝ විශ්වාස කලහ. මෙතැන, යුගයෙන් යුගය දිග හරින ලද, ඔවුන්ගේ කවියන්ගේ පරිකල්පනයන්ට ඔබ්බෙහි වූ අනුකම්පාවේ සහ භීෂණයේ සත්‍ය කථාව ඇත. නමුත් එය මරණයෙන් නොව ජීවිතයෙන් නිමාව දකින කථාවකි. අඳුරු ශෝකාන්තයකින් නොව නොහැසිය හැකි ප්‍රමෝදයකිනි. අප එය සොයා ගැඹුරු ලෙස එතැන සිතනවා නම්, මනුෂ්‍ය වේදනාවේ ගැටලුවේ මධ්‍යයට සහ ලෝකය මිදීමේ දේව අභිප්‍රායේ හදවතට අප රැගෙන යාමේ කථාවක් වනු ඇත.

- එල්. පී. සාජන්ට් -

## පසුව ලිවීම

1967 ජුනි මාසයේ ලෝකය මවිත කල දින හයේ යුද්ධයෙන් වසර කිහිපයකට පමණක් පසු, 1971 දී මෙම කර්තෘ, එංගලන්තයේ බර්මිංහැම්හි ලූවි සාජන්ට්, ක්‍රිස්තුස්වහන්සේ තුළ නිද්‍රාවට පත්විට. එම වසරේදී ඊශ්‍රායලය, තනි සිතකින් යුත් කැපවීමෙන් සහ ධෛර්යවන්ත අධිෂ්ඨානයෙන්, සංඛ්‍යාත්මකව වඩා උසස් සතුරන් අභිබවා මැද පෙරදිග ප්‍රධාන බලවතෙක් ලෙස මතුවිය. 1967 සිට, මැකබී දවස්වල පටන් (ක්‍රිස්තුස්වහන්සේට සියවසක් හෝ වඩා එපිට) පළමු වතාවට, යෙරුසලම දැන් මුලුමනින්ම යුදෙව් පාලනය යටතේ පවතී. ඊශ්‍රායලයේ දේශසීමා, දාවිත් රජුගේ කාලයේ ඒවාට සමානය.

ලෝකමතය බලාපොරොත්තු නොවූ 1967 අනපේක්ෂිත වර්ධනය, අද අපගේ ජීවිත තුළ බයිබල් අනාවැකි ඉටුවීමේ තවත් එක් සලකුණක් පමණි. නමුත් ලේඛකයා විසින් මෙම පොත් පිංචෙහි අවසන් පිටුවල සඳහන් කරන දේ දැන් වඩාත් වැදගත්ය. මක්නිසාද 1949 සිට ඊශ්‍රායෙල් රාජ්‍යය පොළඹවන්නේ ආගමික ප්‍රතිස්ථාවට වඩා ජාතිවාදීව බැව් වඩ වඩා පැහැදිලිය. ඔවුන්ගේ ජයග්‍රහණයන් ගැන ඔවුන් උඩඟු අතර තමන් ආරක්ෂා කර මුදවා ගැනීමේ ආක්‍රමණශීලි විශ්වාසයක් ඔවුන් සතුව ඇත.

නමුත් දිවැසිවරුන්ගේ සාක්ෂිය වන්නේ ඊශ්‍රායලය තමන් විසින්ම බේරා ගැනීමට නොහැකිවන බවත්, දෙවියන්වහන්සේගේ ඍජු ක්‍රියාවෙන් ගැළවීම ලබන බවත්ය. (එසකියෙල් 38 පරිච්චේදයේ අනාවැකි කී ලෙස) උතුරු දිගින් පැමිණෙන මහා ආක්‍රමණිකයා ඊශ්‍රායල්වරුන් විසින් වෙහෙසව සහ උඩඟුව ස්ථාපිත කරන ලද සියල්ල විනාශ කිරීමේ තර්ජනය කිරීමට තවම ඊශ්‍රයෙල් දේශයට පහත්වීමට ඇත. ඔවුන්ගේ බලාපොරොත්තු සම්පූර්ණයෙන් නැති වී ගිය අවස්ථාවක නිසැකවම ඔවුන්ගෙන් සමහරෙක් "දෙවියන්වහන්සේට මොරගසනු" ඇති අතර උන්වහන්සේ මොවුනට සවන් දෙනු ඇත. ඔවුන්ගේ පසු තැවීම උන්වහන්සේ සමඟ නැවත සමගි වීමට සහ ඔවුන්ගේ පොරොන්දුවූ මෙසායාවන ක්‍රිස්තුස්වහන්සේ හට නිහතමානිව යටත් වීමට මාර්ගය විවර කරනවා ඇත. මක්නිසාද උන්වහන්සේ මුලු පෘථිවියට නියමය කල රජු පමණක් නොව, යුදෙව්වන්ගේ රජුදවන හෙයිනි.

උන්වහන්සේගේ පුත්‍රයාවන යේසුස්වහන්සේ ප්‍රතික්ෂේප කලත්, යුදෙව්වන් දෙවියන්වහන්සේ විසින් ආරක්ෂා කරන්නේ ඇයි දැයි බොහෝ අය හට ප්‍රහේලිකාවකි. තවත් බොහෝ අය හට, වසර 2000 කට පෙර යෙරුසලමෙන් එලවා දමනු ලැබූ ඔවුන්, නැවත ඔවුන්ගේ අගනුවර තුළ

ප්‍රතිශ්ධාපනය කිරීමත් වඩා ප්‍රහේලිකාවකි. නමුත් පාවුල් විසින් මෙය විස්තර කරනු ලබයි.

> "මක්නිසාද, සහෝදරයිනි, නුඹලාම ඥානවන්තයෝදැයි නොසිතන පිණිස, මේ අභිරහස නුඹලා නොදැන සිටිනවාට නොකැමැත්තෙමි. එනම් <u>අන්‍ය ජාතීන්ගේ සම්පූර්ණත්වය පැමිණෙන තුරු</u> ඉශ්‍රායෙල්වරුන්ට තරමක් දුරට දැඩිකමක් පැමිණ තිබෙන බවය." (රෝම 11:25)

මෙයින් හැඟවෙන්නේ යුදෙව් නොවන අදහන්නන් පූර්ණ සංඛ්‍යාවක් ඇතිවන තෙක් යුදෙව්වන් විසින් ක්‍රිස්තුස්වහන්සේ පිළිගැනීමේ දවස දෙවියන්වහන්සේ උවමනාවෙන්ම ප්‍රමාද කරන බවය. දැන් යුදෙව්වන් යෙරුසලමට නැවත පැමිණ ඇති බැවින්, දෙවියන්වහන්සේ තව කොපමණ කාලයක් ප්‍රමාද කරන්නේද, නැතහොත් ක්‍රිස්තුස්වහන්සේට ප්‍රතිචාරය කිරීමට යුදෙව් නොවන අය හට කොපමණ කාලයක් ඉතිරි වී ඇත්දැයි අප සැම කල්පනා කල යුතුයි.

- ෆ්‍රෙඩී පියර්ස් -

**"ඊශ්‍රායලය සහ දෙවියන්වහන්සේගේ අභිප්‍රාය" කියැවූ පසු ඔබට පිළිතුරු දීමට ඇති ප්‍රශ්න**

1. ඊශ්‍රායලය සඳහා දෙවියන්වහන්සේට අභිප්‍රායක් ඇත්තේ ඇයි?

2. ඊශ්‍රායලය සඳහා දෙවියන්වහන්සේගේ අභිප්‍රායට යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සම්බන්ධ වන්නේ කෙසේද?

3. යෙරුසලෙම අරහයා දෙවියන්වහන්සේ දී ඇති පොරොන්දු මොනවාද?

4. වර්තමානයේ පවතින ඊශ්‍රායල් රාජ්‍යය ජාතියක් වශයෙන් දෙවියන් වහන්සේගේ දේශය සමඟ කිසි ගණුදෙනුවක් ඇත්ද?

5. ඉහත 4 ට පිළිතුර වශයෙන් දේව වචනයෙන් පදයක් දක්වන්න.

6. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැවත පෘථිවියට පැමිණීම ඊශ්‍රායල් දේශයට කුමක් තකාවන්නේද?

7. අන්‍යජාතික (යුදෙව් නොවන) ජනයාට ඊශ්‍රායලය සමඟ දෙවියන් වහන්සේගේ අභිප්‍රායේ කොටස් කරුවන් විය හැකිද?

8. එසේ නොමැති නම්, ඇයි? එසේ නම්, කෙසේද?

9. ඊශ්‍රායලය නැවත දේශයට පැමිණීම ගැන අනාවැකියක උදාහරණයක් දෙන්න.

10. තවමත් ඉටුවීමට ඇති අනාවැකි ඊශ්‍රායල් සම්බන්ධව තිබේද?